

# පුරාතන සන්න සහ අටුවාව සහිත

# චූලපණ්ණමා සූත්‍රය

පුරාතන සන්නසහා අටුවාව

සහිත

# චූළපුණ්ණමා සූත්‍රය.

උගත් ස්වාමීන්වහන්සේ නමක් ලවා

ශුද්ධකරවාගෙණ

ඩබ්ලිව්. ඩබ්ලිව්. රූපසිංහ

විසින්

කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයෙහි

අච්චුගස්වා ප්‍රසිද්ධකරණලදී

1893

# සංඥාපනය.

මෙම ප්‍රශසත පුරාතන සන්නයහා අර්ථකථායුක්ත "චූලපුණ්ණමං" සූත්‍රය මැදුම්සඟියෙහි "දෙවදහන" වර්ගයට ඇතුලත් සූත්‍රයකි, මේ සූත්‍රයෙන් ප්‍රකාශිත අදහසද අසත්පුරුෂයාත් ඔහුගේ චාරිත්‍රාදියත් සත්පුරුෂයාත් ඔහු ශාන්තගුණයත් මනාව දැන ගෙණ අයහපත් අසත්පුරුෂ සේවනය පහකොට සත්පුරුෂ සේවනයෙන් කෙළවර අමෘතමහානිර්වාණය ලබාගැණීමේමාර්ගයයි.

මේ සූත්‍රයටකර තිබෙන සන්නයද ධර්මධර පුරාතනපණ්ඩිත මෙකු විසින් කර තිබෙන බවද පෙණේ. ඒමේ සන්න කර්තෘ අසවලායයි කිය නොහැකියි.

තවද මේ ගැණ අටුවාවෙහිත් සන්නයෙහිත් වැඩි විස්තර නොලියා තිබෙත්තේ අවබොධයට දුස්කර අතිගම්භීරාර්ථ අවිද්‍යමාන හෙයින්යයි සිතිය හැකියි.

ඒ ඇර මෙය අතින් අතට ලිවීමෙන් ආකූල ව්‍යාකූලව ප්‍රයොජන ගැණීමට දුස්කරව තිබුන නිසාත් මෙය ලොකයා අතට දී මෙත් සුලභකරවන අධ්‍යාශය නිසාත් පරිශීලනයට බාධා නොවනසේ සමර්ථ ස්වාමීන්වහන්සේ නමක් ලවා හැකි තරමින් සුද්ධ කරවාගෙණ තදර්ථ කථාවත් මීට යොදා, පුරාතන සන්නයෙන් යුක්තකොට අච්චුගස්වා මෙසේ ප්‍රසිද්ධ කෙළෙම්.

මෙහි අපගේ ප්‍රමාද භ්‍රමාදියෙන් ජනිත යම් දොසක් ඇතත් එය නැනවත් පණ්ඩිතයන්ගෙන් පිළිවිස නිරාකරණය කිරීමෙන් පරිශීලනයකොට ඒ අනුව පිළිපැද දිව්‍ය මනුෂ්‍යාදී සැප සහ කෙළවර නිවන්සැපත් අත්පත් කරගන්ට උත්සාහ කටයුතුයි.

මෙය නැවත මුද්‍රණය කිරීමේ අයිතිවාසිකම මෙහි නම් පේන මටම තබා ගත්තෙමි.

මෙවනට,

ඩබ්ලිව්. ඩබ්ලිව්. රූපසිංහ.

# චූළපුණ්ණමාසුත්තං.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

එවමෙම සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ, තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ පණ්ණරසෙ පුණ්ණමාය රත්තියා භික්ඛුසඞ්ඝපරිවුතො අබ්භොකාසෙ නිසින්නො හොති—අථ ඛො භගවා තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා භික්ඛූ ආමන්තෙසි.

ජානෙය්‍ය නුඛො? භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසං අසප්පුරිසො අයං භවං'ති, නො හෙතං භන්තෙ, සාධු භික්ඛවෙ, අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං අසප්පුරිසො අසප්පුරිසං ජානෙය්‍ය අසප්පුරිසො අයං භවන්ති.

ජානෙය්‍ය පන භික්ඛවෙ අසප්පුරිසො සප්පුරිසං සප්පුරිසො අයං භවන්ති, නො හෙතං භන්තෙ සාධු භික්ඛවෙ, එතම්පි ඛො භික්ඛවෙ අට්ඨානං අනවකාසො යං අසප්පුරිසො සප්පුරිසං ජානෙය්‍ය සප්පුරිසො අයං භවන්ති.

අසප්පුරිසො භික්ඛවෙ අසද්ධම්මසමන්නාගතො හොති අසප්පුරිසභත්ති හොති අසප්පුරිසචින්තී හොති අසප්පුරිසමන්තී හොති අසප්පුරිසවාචො හොති අසප්පුරිසකම්මන්තො හොති අසප්පුරිසදිට්ඨි හොති අසප්පුරිසදානං දෙති.

කථඤ්ච භික්ඛවෙ අසප්පුරිසො අසද්ධම්මසමන්නාගතො හොති, ඉධ භික්ඛවෙ අසප්පුරිසො අස්සද්ධො හොති අහිරිකො හොති අනොත්තප්පී හොති, අප්පස්සුතො හොති කුසීතො හොති මුට්ඨස්සති හොති දුප්පඤ්ඤො හොති, එවං ඛො භික්ඛවෙ අසප්පුරිසො අසද්ධම්මසමන්නාගතො හොති,

කථඤ්ච භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසභත්ති හොති, ඉධ භික්ඛවෙ අසප්පුරිසස්ස යෙ තෙ සමණබ්‍රාහ්මණා අස්සද්ධා අහිරිකා අනොත්තප්පිනො අප්පස්සුතා කුසීතා මුට්ඨස්සති දුප්පඤ්ඤා ත්‍යාස්ස මිත්තා හොන්ති තෙ සහායා හොන්ති එවං ඛො භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසභත්ති හොති.

කථඤ්ච භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසචින්තී හොති, ඉධ භික්ඛවෙ අසප්පුරිසො අත්තව්‍යාබාධාය'පි චෙතෙති පරව්‍යාබාධාය'පි චෙතෙති උභයව්‍යාබාධාය'පි චෙතෙති, එවං ඛො භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසචින්තී හොති.

කථඤ්ච භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසමන්තී හොතී, ඉධ භික්ඛවෙ අසප්පුරිසො අත්තව්‍යාබාධාය'පි මන්තෙති පරව්‍යාබාධාය'පි මන්තෙති උභයව්‍යාබාධාය'පි මන්තෙති, එවං ඛො භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසමන්තී හොති.

කථඤ්ච භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසවාචො හොති, ඉධ භික්ඛවෙ අසප්පුරිසො මුසාවාදී හොති පිසුණවාචො හොති, ඵරුසාවාචො හොති සම්ඵප්පලාපී හොති, එවං ඛො භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසවාචො හොති.

කථඤ්ච භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසකම්මන්තො හොති, ඉධ භික්ඛවෙ අසප්පුරිසො පාණාතිපාතී හොති අදින්නාදායී හොති කාමෙසු මිච්ඡාචාරී හොති, එවං ඛො භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසකම්මන්තො හොති.

කථඤ්ච භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසදිට්ඨී හොති, ඉධ භික්ඛවෙ අසප්පුරිසො එවං දිට්ඨී හොති, නත්ථි දින්නං නත්ථි යිට්ඨං නත්ථි හුතං නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො නත්ථි අයං ලොකො නත්ථි පරො ලොකො නත්ථි මාතා නත්ථි පිතා නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති'ති, එවං ඛො භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසදිට්ඨී හොති.

කථඤ්ච භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසදානං දෙති, ඉධ භික්ඛවෙ අසප්පුරිසො අසක්කච්චං දානං දෙති, අසහත්ථා දානං දෙති අචිත්තිං කත්වා දානං දෙති අපවිද්ධං දානං දෙති අනාගමනදිට්ඨිකො දානං දෙති, එවං ඛො භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසදානං දෙති.

ස ඛො සො භික්ඛවෙ අසප්පුරිසො එවං අසද්ධම්මසමන්නාගතො එවං අසප්පුරිසභත්ති එවං අසප්පුරිසචින්තී එවං අසප්පුරිසමන්තී එවං අසප්පුරිසවාචො එවං අසප්පුරිසකම්මන්තො එවං අසප්පුරිසදිට්ඨී එවං අසප්පුරිසදානං දත්වා කායස්ස භෙදා පරම්මරණා යා අසප්පුරිසානං ගති තත්ථ උප්පජ්ජති, කා ච භික්ඛවෙ අසප්පුරිසානං ගති, නිරයො වා තිරච්ඡානයොනි වා.

ජානෙය්‍ය නු ඛො භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසං සප්පුරිසො අයම්භවන්ති, එවම්භන්තෙ සාධු භික්ඛවෙ ඨානමෙතං භික්ඛවෙ විජ්ජති යං සප්පුරිසො සප්පුරිසං ජානෙය්‍ය සප්පුරිසො අයම්භවන්ති.

ජානෙය්‍ය පන භික්ඛවෙ සප්පුරිසො අසප්පුරිසං අසප්පුරිසො අයම්භවන්ති, එවම්භන්තෙ සාධු භික්ඛවෙ එතම්පි ඛො භික්ඛ

වෙ ඨානං විජ්ජති යං සප්පුරිසො අසප්පුරිසං ජානෙය්‍ය අසප්පුරිසො අයම්භවන්ති.

සප්පුරිසො භික්ඛවෙ සද්ධම්මසමන්නාගතො හොති සප්පුරිසභත්ති හොති සප්පුරිසචින්තී හොති සප්පුරිසමන්තී හොති සප්පුරිසවාචො හොති සප්පුරිසකම්මන්තො හොති සප්පුරිසදිට්ඨි හොති සප්පුරිසදානං දෙති.

කථඤ්ච භික්ඛවෙ සප්පුරිසො සද්ධම්මසමන්නාගතො හොති ඉධ භික්ඛවෙ සප්පුරිසො සද්ධො හොති හිරිමා හොති ඔත්තප්පී හොති බහුස්සුතො හොති ආරද්ධවිරියො හොති උපට්ඨිතසති හොති පඤ්ඤවා හොති, එවං ඛො භික්ඛවෙ සප්පුරිසො සද්ධම්මසමන්නාගතො හොති.

කථඤ්ච භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසභත්ති හොති, ඉධ භික්ඛවෙ සප්පුරිසස්සයෙ තෙ සමණබ්‍රාහ්මණා සද්ධා හිරිමන්තා ඔත්තප්පිනො බහුස්සුතා ආරද්ධවිරියා උපට්ඨිතසති පඤ්ඤවන්තො ත්‍යාස්ස මිත්තා හොන්ති තෙ සහායා හොන්ති, එවං ඛො භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසභත්ති හොති,

කථඤ්ච භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසචින්තී හොති, ඉධ භික්ඛවෙ සප්පුරිසො නෙවත්තබ්‍යාබාධාය චෙතෙති න පරබ්‍යාබාධාය චෙතෙති න උභයබ්‍යාබාධාය චෙතෙති, එවං ඛො භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසචින්තී හොති.

කථඤ්ච භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසමන්තී හොති, ඉධ භික්ඛවෙ සප්පුරිසො නෙවත්තබ්‍යාබාධාය මන්තෙති න පරබ්‍යාබාධාය මන්තෙති න උභයබ්‍යාබාධාය මන්තෙති, එවං ඛො භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසමන්තී හොති.

කථඤ්ච භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසවාචො හොති, ඉධ භික්ඛවෙ සප්පුරිසො මුසාවාදා පටිවිරතො හොති පිසුණාවාචා පටිවිරතො හොති ඵරුසාවාචා පටිවිරතො හොති සම්ඵප්පලාපා පටිවිරතො හොති, එවං ඛො භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසවාචො හොති.

කථඤ්ච භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසකම්මන්තො හොති, ඉධ භික්ඛවෙ සප්පුරිසො පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානා පටිවිරතො හොති කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, එවං ඛො භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසකම්මන්තො හොති.

කථඤ්ච භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසදිට්ඨි හොති, ඉධ භික්ඛවෙ සප්පුරිසො එවං දිට්ඨිකො හොති අත්ථි දින්නං අත්ථි යිට්ඨං අත්ථි හුතං අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො අත්ථි අයං ලොකො අත්ථි පරෙ ලොකො අත්ථි මාතා අත්ථි පිතා අත්ථි

සත්තා ඔපපාතිකා අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති, එවං ඛො භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසදිට්ඨී හොති.

කථඤ්ච භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසදානං දෙති, ඉධ භික්ඛවෙ සප්පුරිසො සක්කච්චං දානං දෙති සහත්ථා දානං දෙති චිත්තීකත්වා දානං දෙති අනපවිද්ධං දානං දෙති ආගමනදිට්ඨිකො දානං දෙති, එවං ඛො භික්ඛවෙ සප්පුරිසො සප්පුරිසදානං දෙති,

ස ඛො සො භික්ඛවෙ සප්පුරිසො එවං සද්ධම්මසමන්නාගතො එවං සප්පුරිසභත්තී එවං සප්පුරිසචින්තී එවං සප්පුරිසමන්තී එවං සප්පුරිසවාචො එවං සප්පුරිසකම්මන්තො එවං සප්පුරිසදිට්ඨී එවං සප්පුරිසදානං දත්වා කායස්ස භෙදා පරම්මරණා යා සප්පුරිසානං ගති තත්ථ උපපජ්ජති, කා ච භික්ඛවෙ සප්පුරිසානං ගති, දෙවමහන්තතා ච මනුස්සමහන්තතා චා'ති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

චූලපුණ්ණමාසුත්තං.

---

### අට්ඨකථා.

'එවමෙම්සුත"න්ති චූලපුණ්ණමාසුත්තං - තත්ථ "තුණ්හීභූතං තුණ්හීභූත"න්ති යං යං දිසං අනුවිලොකෙති තත්ථ තත්ථ තුණ්හීභූතමෙව 'අනුවිලොකෙත්වා"ති පඤ්චපසාදපතිමණ්ඩිතානි අක්ඛීනි උම්මීලෙත්වා තතො විලොකෙත්වා අන්තමසො හත්ථකුක්කුච්චපාදකුක්කුච්චානම්පි අභාවං දිස්වා - "අසප්පුරිසො"ති පාපපුරිසො, "නොහෙතං භන්තෙ"ති යස්මා අන්ධො අන්ධං විය තං ජානිතුං න සක්කොති තස්මා එවමාහංසු - එතෙනෙව නයෙන ඉතොපරෙසු'පි අත්ථො වෙදිතබ්බො — "අසද්ධම්මසමන්නාගතො"ති පාපධම්මසමන්නාගතො "අසප්පුරිසභත්තී"ති අසප්පුරිසසෙවනො "අසප්පුරිසචින්තී"ති අසප්පුරිසචින්තාය චින්තකො "අසප්පුරිසමන්තී"ති අසප්පුරිසමන්තනං මන්තෙන්තො "අසප්පුරිසවාචො"ති අසප්පුරිසවාචං භාසිතා "අසප්පුරිසකම්මන්තො"ති අසප්පුරිසකම්මානං කත්තා "අසප්පුරිසදිට්ඨී"ති අසප්පුරිසදිට්ඨියා සමන්නාගතො "අසප්පුරිසදානං"ති අසප්පුරිසෙහි දාතබ්බං දානං "තස්සමිත්තො"ති තෙ අස්ස මිත්තා "අත්තබ්‍යාබාධාය'පි චෙතෙති"ති පාණං හනිස්සාමි අදින්නං ආදියිස්සාමි මිච්ඡා චරිස්සාමි දසඅකුසලකම්මපථෙ සමාදාය වත්තිස්සාමී'ති එවං අත්තනො දුක්ඛත්ථාය චින්තෙති "පරබ්‍යාබාධායා'ති යථා අසුකො අසුකං පාණං හනති

අසුකස්ස සන්තිකා අදින්නං ආදියති දසඅකුසලකම්මපථෙ සමාද
ය වත්තතී' එවං තං ආනාපෙස්සාමී'ති එවං පරස්ස දුක්ඛත්ථාය චි
න්තෙති; "උභයව්‍යාබාධාය"ති අහං අසුකංච අසුකංච ගහෙත්වා
දසඅකුසලකම්මපථෙ සමාදාය වත්තිස්සාමී'ති එවං උභයදුක්ඛ
ත්ථාය චින්තෙති; "අත්තව්‍යාබාධාය'පි මනෙතති""ති" ආදිසු අහං ද
සඅකුසලකම්මපථෙ සමාදාය වත්තිස්සාමී'ති මනෙතනෙතා අත්ත
ව්‍යාබාධාය මනෙතති නාම, අසුකා දසඅකුසලකම්මපථෙසු සමාද
පෙස්සාමී'ති මනෙතනෙතා "පරව්‍යාබාධාය මනෙතති"නාම-අ
ඤ්ඤුතසද්ධිං මයං උභො'පි එකතො හුත්වා දසඅකුසලකම්මප
ථෙ සමාදාය වත්තිස්සාමී'ති මනෙතනෙතා "උභයව්‍යාබාධාය ම
නෙතති" නාම—"අසක්කච්චං දානං දෙති"ති දෙය්‍යධම්මම්පි
පුග්ගලම්පි න සක්කරොති; "දෙය්‍යධම්මං න සක්කරොති" නාම
උත්තණ්ඩුලාදිදොස සමන්නාගතං ආහාරං දෙති න සම්පන්නං ක
රොති—"පුග්ගලං න සක්කරොති"නාම නිසීදනට්ඨානං අසම්ම
ජ්ජිත්වා යත්ථ වා තත්ථ වා නිසීදාපෙත්වා යං වා තං වා ආධාරකං ඨ
පෙත්වා දානං දෙති; "අසහත්ථා"ති න අත්තනො හත්ථෙන දෙති
දාසකම්මකරාදීහි දාපෙති; "අචිත්තීකත්වා"ති හෙට්ඨා වුත්තනයෙ
න දෙය්‍යධම්මෙ'පි පුග්ගලෙ'පි න චිත්තීකාරං කත්වා දෙති; "අ
පවිද්ධං"ති, ඡඩ්ඩෙතුකාමො හුත්වා වම්මිකෙ උරගං පක්ඛිපන්තො
විය දෙති; "අනාගමනදිට්ඨිකො"ති නො ඵලපාටිකඞ්ඛී හුත්වා
දෙති, "තත්ථ උප්පජ්ජති"ති න දානං දත්වා නිරයෙ උප්පජ්ජති යං
පන තෙනෙව පාපලද්ධිකාය මිච්ඡාදස්සනං ගහිතං තාය දිට්ඨියා
නිරයෙ උප්පජ්ජති—සුක්කපක්ඛො වුත්තපටිපක්ඛනයෙන වෙදි
තබ්බො—"දෙවමහත්තතා"ති ඡ කාමාවචරදෙවා "මනුස්සමහ
ත්තතා"ති තිණ්ණං කුලානං සම්පත්ති—සෙසං සබ්බත්ථ උත්තා
නමෙවාති—ඉදං පන සුත්තං සුද්ධවට්ටවසෙනෙව කථිතන්ති—

චූලපුණ්ණමාසුත්තට්ඨකථා නිට්ඨිතා.

---

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස.**

---

මෙ, මාවිසින්; මේ චූලපුණ්ණමා සූත්‍රාන්ත ධර්මදෙශනාව, එවං
සුතං, (මේ ආකාරයෙන් අසනලද මෙසේ අසනලද) මෙසේම
අසනලදී; නොහොත්; මෙ, මාගේ; සුතං, ශ්‍රැතිය; හෙවත්, මේ
සූත්‍රාන්තධර්මදෙශනාවගේ ඇසීම; එවං, මෙසේමැයි; එකං සම
යං, එක් සමයෙක්හී; භගවා, භාග්‍යවත් බුදුරජානන්වහන්සේ;
සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; මිගාරමාතුපාසාදෙ, (මි

ගාරමාතුනම්වූ විසාඛා මහා උපාසිකාවන් විසින් කරවා පිළිගන්වනලද හෙයින්) මිගාරමාතුපාසාද නම්වූ; පුබ්බාරාමෙ, පූර්වාරාම මහාවිහාරයෙහි; විහරති, වැඩවාසයකර වදාරණසේක;—තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහී; භගවා, (අපරිමිත පුණ්‍ය යශශ්‍රී සම්භාර ගුණසමුදාම ඍද්ධිතොහතම) භාග්‍යවතුන් වහන්සේ; තදහුපොසථෙ, එදවස් පැමිණි උපෝසථය ඇති; පණ්ණරසෙ, පසළොස්වක්දිනයෙහි; පුණ්ණමාය, සම්පූර්ණවූ චන්ද්‍රයා ඇති; රත්තියා, එදවස් රාත්‍රියෙහි; හෙවත්, පසළොස්පැය ගියවේලෙහි; භික්ඛුසඞ්ඝපරිවුතො, ශ්‍රමණගණයා විසින් පිරිවරණලද්දේ; අබ්භොකාසෙ, (ඉට්ඨිකාච්ඡදන පණ්ණච්ඡදනාදීන් විරහිතවූ) අභ්‍යවකාශයෙහි; නිසින්නො හොති, (පූර්ණචන්ද්‍රමණ්ඩලයසේ ප්‍රඥප්තවර බුද්ධාශන මස්තකයෙහි) වැඩඋන්සේක.

අථඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; තුණ්හීභූතං තුණ්හීභූතං, (තමන්වහන්සේ දශාවට දෙහොත්මුදුනෙහි තබා නමස්කාරකොට) තුෂ්ණීම්භූතව තුෂ්ණීම්භූතව හුන්නාවූ; භික්ඛුසඞ්ඝං, භික්ෂු සඞ්ඝයා දශාව; අනුවිලොකෙත්වා, අනුලොමප්‍රතිලොම වශයෙන් බලා වදාරා; භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි, අඩගා වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, (ශාන්තවූ සත්පුරුෂ ගුණය නැතිහෙයින්) එබඳු අසත්පුරුෂතෙම; අසප්පුරිසං, (එබඳු පවිවූ අදහස් ඇති) අසත්පුරුෂයාද; (ඔහුගේ පාපක්‍රියාවද;) අයංභවං, මෙතෙම; අසප්පුරිසො ඉති, අසත්පුරුෂයයි කියා; ජානෙය්‍යනුඛො, ඉඳින් දන්නේහෝවේද; භන්තෙ, ස්වාමීන්වහන්ස; එතං, මෙසේ දැනගැන්මක්; නොහි, නැත්තේයයි දන්වූසේක්‍ය; භික්ඛවෙ, මහණෙනි; සාධු, ඒ එසේමය; භික්ඛවෙ, මහණෙනි අසප්පුරිසො, අසත්පුරුෂතෙම; අයංභවං, මොහු; අසප්පුරිසො ඉති, අසත්පුරුෂවන්නේයයි කියා; අසප්පුරිසං, අසත්පුරුෂයා; යං ජානෙය්‍ය, යම් පරිද්දෙකින් දන්නේවීනම්; එතං, මේ දැනගැන්ම; අට්ඨානං, (අන්ධයෙකුමෙන් අසත්පුරුෂයා දැකීමට) කාරණ නොවන්නේය; අනවකාසො, එබඳු ප්‍රත්‍යයකුදු නොවන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, (කුසලාකුසල මාතෘ පිතෘ බුදුසව් ආදීන්ගේ ගුණ නොදන්නා) අසත්පුරුෂතෙම; සප්පුරිසං, (වාරත්‍රයෙන් සුචරිත ධර්මයෙන් යුක්තව කරුණාමුදිතාදිවූ සිත් ඇති) සත්පුරුෂයාද (ඔහුගේ ශාන්ත ගුණයද;) අයං පන, මෙතෙම වනාහි; සප්පුරිසො ඉති, සත්පුරුෂයායයි කියා; ජානෙය්‍යාපන, දන්නේවේද; භන්තෙ, ස්වාමීන්වහන්ස; එතං, මෙසේ දැන්මක්; නොහි, නැත්තේය; භික්ඛවෙ, මහණෙනි; සාධු, යහ

පත; භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො,(දුෂට ක්‍රියාවන් ඇති)අ
සත්පුරුෂතෙම, අයං, මෙතෙම, සප්පුරිසො භවන්ති, සත්පුරුෂ
වන්නේයයි කියා; සප්පුරිසං,සත්පුරුෂයාද;(ඔහුගේ ශාන්ත ගුණ
යද්‍ය ජානෙය්‍ය, යම්පරිද්දෙකින් දන්නේවිනම්; භික්ඛවෙ, මහ
ණෙනි; එතම්පිඛො, ඒ දැන්මද වනාහි; අට්ඨානං, අට්ඨාන වන්
නේය; හෙවත්, කාරණ නොවන්නේය; අනවකාසො, අවකා
ශද නොවන්නේය; හෙවත්, දැනගන්නා ප්‍රත්‍යයෙක් අසත්පුරු
ෂයා කෙරෙහි නොමඇත්තේයයි වදාළසේක.

(එඹා පින්වත් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂ ජනයෙනි ත්‍රිභුනාධාර ජ
ගදෙශ්වර සර්වඥරාජෝත්තමයානන්වහන්සේ එක්සමයෙක්හි සැ
වැත්නුවර නිසා විසාඛාමහඋපාසිකාවන් විසින් කරවා පිළිගන්
වනලද පූර්වාරාම මහාවිහාරයෙහි වැඩවාසයකර වදාරණසේක්
පූර පසළොස්වක්ලත් පොහෝදිනයෙහි සඳපහන අබ්භ්‍යවකා
ශයෙහි පනවනලද බුද්ධාසනයෙහි වැඩහිඳ භික්ෂූන්දෙස බලා
වදාරු මහණෙනි අසත්පුරුෂයාට අනික් අසත්පුරුෂයෙක් මොහු
අසත්පුරුෂයායයිකියා දැනගත්ට පිළිවන්දැයි විචාරා වදාළසේක.)

භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, (කෘතීතාවෘකෘතීතාව්‍ය නො
දන්නා) දුර්ජනතෙම, අසද්ධම්ම සමන්නාගතොහොති, පාපධ
ර්ම සමාදානයෙන් යුක්තවන්නේය,අසප්පුරිසභත්තිහොති, තමා
දුර්ජනහෙයින් දුර්ජනයන්කෙරෙහි භක්ති ඇතිවන්නේය; අස
ප්පුරිස චින්තිහොති, නපුරු සිතිවිල්ලක්ම සිතන්නේය; අසප්පු
රිසමන්තිහොති, පාපපුද්ගලයන්හා සමග මන්ත්‍රණය කරන්නේ
ය; අසප්පුරිස කම්මන්තොහොති, අසත්පුරුෂ ක්‍රියාවන් ඇතිවන්
නේය; අසප්පුරිසවාචොහොති, අසත්පුරුෂ වචනයන් කියන්නේ
ය; නොහොත්,අසත්පුරුෂ වචන ඇත්තෙක්වන්නේය; අසප්පුරි
සදිට්ඨිහොති, අසත්පුරුෂ දෘෂ්ටියම පහලකරන්නේය; අසප්පුරි
සදානං දෙති, අසත්පුරුෂවූ දන් දෙන්නේය.

භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; කථංච
කොසේනම්; අසද්ධම්මසමන්නාගතො හොති, අසද්ධර්මයෙන් සම
න්වාගතවේද;භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි,අසප්පු
රිසො, අසත්පුරුෂතෙම; අස්සද්ධොහොති, ශ්‍රද්ධාව නැත්තේවේද;
අහිරිකොහොති, පාපයෙහි ලජ්ජා නැත්තේවේද; අනොත්තප්පි
හොති, පාපයෙහි භය නැත්තේවේද; අප්පස්සුතොහොති, අල්ප
ශෘතවූයේවේද; කුසීතොහොති,කෞසීල්‍යවූයේවේද;මුට්ඨස්සති;
හොති, සිහිමුලාවූයේවේද; දුප්පඤ්ඤොහොති, ප්‍රඥාහීනවූයේවේද;
එවංඛො, මෙසේද වනාහි; භික්ඛවෙ, මහණෙනි; අසප්පු
අසත්පුරුෂතෙම;අසද්ධම්මසමන්නාගතො හොති, අසද්ධර්
සමන්වාගතවන්නේය.

භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; කථඤ්ච, කෙසේනම්; අසප්පුරිසභත්ති හොති, ලාමක භක්ති ඇත්තේවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි; යෙ තෙ සමණබ්‍රාහ්මණා, යම් ඒ මහණ බමුණුකෙණෙක්; අස්සද්ධා, අශ්‍රද්ධාවෙන් යුක්තවෙත්ද; අහිරිකා, (අසූචියෙහි පිළිකුල් නොවන ග්‍රාමසූකරශෘගාලාදීන්මෙන් පාපයෙහි පිළිකුල් කොට) ලජ්ජා නැත්තෝවෙත්ද; අනොත්තප්පිනො, පාපයෙහි භයනැත්තෝවෙත් අප්පස්සුතා, අල්පශ්‍රැතවූවාහුද; කුසීතා, කුසීත සිත් ඇත්තාහුවෙත්ද; මුට්ඨස්සතී, මුලාවූ සිහි ඇතිවෙත්ද; දුප්පඤ්ඤා, ලාමක ප්‍රඥාව ඇතිවෙත්ද; තෙ, ඒ මහණ බමුණෝ; අයං අසප්පුරිසස්ස, (යටකියානලද) ඒ අසත්පුරුෂයාගේ; මිත්තා හොන්ති, මිත්‍රයෝවන්නාහු ය; තෙ, ඔවුහු; සහායා හොන්ති, (අසූචියට අසූචිය නොවෙනස් වාසේ (ඔවුනොවුන්) සහායවන්නාහු ය; භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; එවංඛො, මෙසේ වනාහී; අසප්පුරිසභත්තිහොති, (තමාගේ අසත්පුරුෂ ගුණ ඇතිහෙයින්) අසත්පුරුෂයන්හා භක්ති ඇතිවන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; කථඤ්ච, කෙසේනම්; අසප්පුරිස චින්තීහොති, අසත්පුරුෂ සිතිවිලි සිතන්නේවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; අත්තව්‍යාබාධාය'පි චෙතෙති, (කෙසේනම් ප්‍රාණඝාතාදී දසඅකුසල් කෙරෙම්දැයි සිතියා) තමහට පීඩාපිණිස සිතන්නේය; පරව්‍යාබාධාය'පි චෙතෙති, අනුන්ලවා පාපයෙහි යොදවම් යන උපායෙක්ම සිතන්නේය; උභයව්‍යාබාධාය'පි චෙතෙති, තමන්ටද අනුන්ටද දුඃඛදායකවූ සිතිවිල්ලක්ම සිතන්නේය; භික්ඛවෙ, මහණෙනි; එවංඛො, මෙසේ වනාහී; අසප්පුරිසො, උක්තප්‍රකාර අසත්පුරුෂතෙම; අසප්පුරිසචින්තීහොති, (උභයලොකාර්ථසිද්ධියක් නැතිහෙයින්) ප්‍රාණඝාතාදිවූ සිතිවිල්ලක්ම සිතන්නේය.

භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; කථඤ්ච, කෙසේනම්; අසප්පුරිසමන්තී හොති, අසත්පුරුෂ මන්ත්‍රණ ඇත්තේවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; අත්තව්‍යාබාධාය'පි මන්තෙති, තෙමේ තමහට විසම ක්‍රියාම සිතන්නේය; පරව්‍යාබාධාය'පි මන්තෙති, පරහට දුක්ඵලවන්නාවූ කාරණා සෙවීම් වශයෙන් මන්ත්‍රණය කරන්නේය; උභයව්‍යාබාධාය'පි මන්තෙති, තමහටද අනුන්ටද අනිෂ්ටවිපාකවූ නපුරුමන්ත්‍රණයක්ම කරන්නේය; භික්ඛවෙ, මහණෙනි; එවංඛො, මෙසේ වනාහී; අසප්පුරිසො, දුර්ජනතෙම; අසප්පුරිසමන්තීහොති, අනිෂ්ටදායකවූ මන්ත්‍රණයෙක්ම කරන්නේවේ

භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, ලාමකාධ්‍යාශයන් ඇති අසත්පුරුෂතෙම; කථඤ්ච, කෙසේනම්; අසප්පුරිසවාචො හොති, අසත්පුරුෂ වචන ඇත්තේවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි; අසප්පුරිසො, (බුද්ධපසේබුද්ධ මහරහතුන් විසින් නින්‍දාකරණලද) අසත්පුරුෂතෙම; මුසාවාදීහොති, (දත්නාදෙය නොදන්නාසේ) දැන දැන බොරු කියත්තේය; පිසුනාවාචො හොති, පෛශුන්‍ය වචන වශයෙන් කේලාම් කියන්නේය; ඵරුසාවාචොහොති, (අප්‍රිය අමනාප අමනොඥ) ඵරුෂ වචන කියත්තේය; සම්ඵප්පලාපී හොති, (මෙලොව පරලොව දෙලොවම වැඩනැති) ඵරුෂවචනයන් කියත්තේය; එවංඛො, මේ ප්‍රකාරයෙන් චනාහී; භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, (නිර්ගුණඇති) අසත්පුරුෂතෙම; අසප්පුරිසවාචො හොති, (මෘෂාවාදාදී) අසත්පුරුෂ වචනයන් කියන්තේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; කථඤ්ච, කෙසේනම්; අසප්පුරිසකම්මන්තො හොති, අසත්පුරුෂකර්මාන්ත ඇත්තේවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; පාණාතිපාතී හොති, ප්‍රාණඝාත කරන්නේවේද; අදින්නාදායී හොති, සොරකම් කරන්නේවේද; කාමෙසු මිච්ඡාචාරී හොති, කාමමිථ්‍යාචාර කරන්නේද; භික්ඛවෙ, මහණෙනි; එවංඛො, මේ ප්‍රකාරයෙන් චනාහී; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; අසප්පුරිස කම්මන්තො හොති, (බුද්ධාදී මහොත්තමයන් විසින් ප්‍රතිකූල කටයුතු) නින්‍දිතවූ ක්‍රියාවන් කරන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; අසප්පුරිසො, (හීනාධ්‍යාශඇති) පාප පුද්ගලතෙම; කථඤ්ච, කෙසේනම්; අසප්පුරිසදිට්ඨී හොති, ලාමකදෘෂ්ටි ඇත්තේවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේලොකයෙහි, අසප්පුරිසො, විපරීතදෘෂ්ටියෙන්යුක්ත පුද්ගලතෙම; එවං දිට්ඨී හොති, මෙබඳු දෘෂ්ටි ඇත්තෙක්වේ; නත්ථි දින්නං, දෙනලද දානයාගේ ඵලවිපාක නැත්තේයයි කියාද; නත්ථි සිට්ඨං, කරණලද පූජාසත්කාරාදියෙහි ඵලවිපාකනැත්තේයයි කියාද; නත්ථි හුතං, වෙහෙරට ගෙණයනලද පූජාවෙහි ඵලවිපාක නැත්තේයයි කියාද; නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, කරණලද කුසලාකුසලකර්මයන්ගේ ඵලවිපාකනැත්තේයයි කියාද; නත්ථි අයං ලොකො, පරලොව සිටියහට මෙලොව නැත්තේයයි කියාද; නත්ථිපරොලොකො, මෙලොවසිටියහට පරලොව නැත්තේයයි කියාද, නත්ථි මාතා, මෑනියන්ටකළ සත්කාර සම්මානයෙහි ඵලවිපාකනැත්තේයයි කියාද; නත්ථි පිතා, පිතෘන්විෂයෙහි කරණලද සත්කාරසම්මානයෙහි ඵලවිපාක නැත්තේයයි කියාද; නත්ථි

සත්තා ඔපපාතිකා, මරණින් මත්තෙහි ඔපපාතිකව උපදිනා සත්වකෙණෙක් නැත්තේයයි කියාද; ලොකෙ, ලොකයෙහි; සම්මග්ගතා, සම්‍යක් මාර්ගයට ගියාවූ; සම්මා පටිපන්නා, සම්‍යක්ප්‍රතිපත්තියට පැමිණියාවූ; ඉමඤ්ච ලොකං, මෙලොවද; පරඤ්ච ලොකං, පරලොවද; සයං අභිඤ්ඤාය, තමාවිසින්ම දැන; සච්ඡිකත්වා, සාක්ෂාත්කොට; පවෙදෙන්ති, ලොකයාහට ප්‍රකාශකොට කියත්නාවූ; යෙ සමණබ්‍රාහ්මණා, යම් ශ්‍රමණබ්‍රාහ්මණකෙණෙක් ඇද්ද; (ඒ ශ්‍රමණබ්‍රාහ්මණයෝ) නත්‍ථී'ති, නැත්තේයයි කියාද; භික්ඛවෙ, මහණෙනි; එවංඛො, මෙසේම වනාහී; අසප්පුරිසො; අසත්පුරුෂතෙම; අසප්පුරිස දිට්ඨි හොති, විපරීත දෘෂ්ටි ඇතිවත්තේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි, අසප්පුරිසො, අසත්පුරුෂතෙම; කථඤ්ච, කෙසේනම්; අසප්පුරිසදානං දෙති, අසත්පුරුෂවූ දන්දෙන්නේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේලොකයෙහි; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; අසක්කච්චං දානං දෙති, සකස්නොව (අපිරිසිදුකොට) දන් දෙන්නේයි; අසහත්‍ථා දානං දෙති, (තමාගේසවහස්තයෙන්නොදී) අනුත්ලවා දන් දෙන්නේය; අචිත්තී කත්වා දානං දෙති, සිතපිරිසිදු නොකොට දන්දෙන්නේය; අපවිද්ධං දානං දෙති, (තුඹසට දමනලද නයෙකුමෙන්) කිසි අපෙක්ෂාවක් නැතිවදන්දෙන්නේය; අනාගමණදිට්ඨිකො දානං දෙති, මෙසේ දෙනලද දානයෙහි ඵලවිපාක නැත්තේයයි සිතා දන් දෙන්නෙය; භික්ඛවෙ, මහණෙනි; එවංඛො, මෙසේද වනාහී; අසප්පුරිසො, අසත්පුරුෂතෙම; අසප්පුරිස දානං දෙති, මෙබඳු අසත්පුරුෂ මහදන්දෙන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි, එවං, මෙසේම; අසප්පුරිසභත්ති, අසත්පුරුෂ භක්තිඇත්තාවූ; එවං, මෙසේ; අසප්පුරිසචින්ති, අසත්පුරුෂ සිතිවිලි ඇත්තාවූ; එවං, මෙසේ; අසප්පුරිසමන්ති, අසත්පුරුෂ මන්ත්‍රණය ඇත්තාවූ; එවං, මෙසේ; අසප්පුරිසවාචො, අසත්පුරුෂ වචන ඇත්තාවූ; එවං, මෙසේ; අසප්පුරිසකම්මන්තො, අසත්පුරුෂ කර්මාන්ත ඇත්තාවූ; එවං, මෙසේ; අසප්පුරිසදිට්ඨි, අසත්පුරුෂ දෘෂ්ටිඇත්තාවූ; එවං, මෙසේ; අසද්ධම්මසමන්නාගතො, අසද්ධර්මමාදානයෙන් යුක්තවූ; සබොසො අසප්පුරිසො, ඒ මේ අසත්පුරුෂතෙම; එවං, මෙසේ; අසප්පුරිසදානං දත්වා, අසත්පුරුෂදානය ප්‍රදානයකොට; කායස්ස භෙදා, කරජකායයාගේ බිඳීමෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; යා අසප්පුරිසානං ගති, අසත්පුරුෂයන්ට ගතිවූයේ යම්තැනක්ද; තත්‍ථ උපපජ්ජති, එතැන්හි උපදනේය;–
භික්ඛවෙ, මහණෙනි, අසප්පුරිසානං ගති, අසත්පුරුෂයන්ගේ ග

තියා; තාව, කවරීද; ? නිරයොවා තිරච්ඡානයොනීවා, නරකයෙහෝ
තිරිසන්අපාය හෝ (යනමෙහි උපදනේයයි වදාළසේක).

භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, (මෙලොව පරලොව වැඩ
අවැඩ දන්නා) ශ්‍රද්ධාවන්තතෙම; සප්පුරිසං, සත්පුරුෂයාද; (ඔහුගේ
ශාන්තගුණයද) සප්පුරිසො අයං භවන්ති, මේසත්පුරුෂයයිකියා;
ජානෙය්‍ය නුබො, ඉදින් දන්නේවේද, එවං භනෙත, එසේය ස්වා
මීන් වහන්සේ යයි කීය; භික්ඛවෙ, මහණෙනි; සාධු, ඒ කාරණය
එසේමය; භික්ඛවෙ, මහණෙනි, සප්පුරිසො, සත්පුරුෂතෙම; (අ
ර්ථානර්ථදන්නා ප්‍රඥාවන්තතෙම); සප්පුරිසො අයංභවන්ති, මේ
තෙම සත්පුරුෂයයි කියා; සප්පුරිසං, සත්පුරුෂයාද; (ඔහුගේ ශා
න්තගුණයද; )යං ජානෙය්‍ය, යම්පරිද්දෙකින් දන්නේවීනම්; එතං
ඨානං, මේ කාරණයද; විජ්ජති, සත්පුරුෂයාකෙරෙහි ඇතුලත්
වන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි, සප්පුරිසො, (පාපයෙහි ආදීනවය කුස
ලයෙහි ඵලවිපාකය දන්නා) සත්පුරුෂතෙම; අසප්පුරිසො අයං
භවන්ති, මේ තෙම අසත්පුරුෂයායයි කියා; අසප්පුරිසං, අසත්පුරු
ෂයාද; (ඔහුගේ නිර්ගුණයද;) ජානෙය්‍ය පන, දන්නාසේක්ද; එ
වං භනෙත, එසේය ස්වාමීන්වහන්ස; භික්ඛවෙ, මහණෙනි, සා
ධු, ඒ එසේමය; සප්පුරිසො, සත්පුරුෂතෙම; අසප්පුරිසො අයං භ
වන්ති, මේ තෙම අසත්පුරුෂයායයි කියා; අසප්පුරිසං, අසත්පු
රුෂයාද; (ඔහුගේ පාපක්‍රියාවද;) යං ජානෙය්‍ය, යම් පරිද්දෙකින්
දන්නේවේද; භික්ඛවෙ, මහණෙනි; එතම්පි ඨානං, ඒ කාරණය
ද වනාහී; විජ්ජති ඛො, විද්‍යමානවන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, සත්පුරුෂ පුද්ගලතෙම;
සද්ධම්මසමන්නාගතො හොති, සද්ධර්ම සමාදානයෙන් යුක්තවන්
නේය; සප්පුරිසභත්ති හොති, සත්පුරුෂවූ භක්තිඇතිවන්නේය;
සප්පුරිස චින්තී හොති, සත්පුරුෂ සිතිවිල්ලක්ම සිතන්නේය; ස
ප්පුරිසමන්තී හොති, යහපත් මන්ත්‍රණයක්ම කරන්නේය; සප්පු
රිස වාචො හොති, යහපත් වචනයක්ම කියන්නේය; සප්පුරිසක
ම්මන්තො හොති, යහපත් කර්මාන්තයක්ම කරන්නේය; සප්පුරි
ස දිට්ඨී හොති, සත්පුරුෂදෘෂ්ටියෙක්ම ඇතිවන්නේය; සප්පුරිසදා
නං දෙති, සත්පුරුෂවූ මහදන් දෙන්නේය.

භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, සුභාසුභදන්නා ප්‍රඥාවන්ත
තෙම; කථංචව, කෙසේනම්; සද්ධම්මසමන්නාගතො හොති,
සද්ධර්මසමාදානයෙන් යුක්තවන්නේද; භික්ඛවෙ, මහණෙනි, ඉ
ධ, මේ ලොකයෙහි; සප්පුරිසො, සත්පුරුෂතෙම; සද්ධො හොති,
ශ්‍රද්ධාඇත්තේවේද; හිරිමා හොති, (පාපයෙහි ජුගුප්සා කාරයෙන්
පවත්නාවූ) ලජ්ජා ඇති වන්නේද; ඔත්තප්පී හොති, පාපයෙහි භ

යඇතිවත්තේද; බහුස්සුතො හොති;(ශ්‍රවණ උද්ග්‍රහණ ධාරණ
දී වශයෙන්) බහුශ්‍රුතවත්තේද; ආරද්ධවිරියො හොති, වඩනාල
ද වීර්‍ය්‍ය ඇතිවත්තේද; උපට්ඨිතසති හොති, පිහිටුවනලද සිහි
ඇතිවත්තේද; පඤ්ඤවා හොති (ලෞකිකලොකොත්තර) ප්‍රඥා
ඇතිවත්තේද; භික්ඛවෙ, මහණෙනි; එවංඛො, මෙසේද වනාහි;
සප්පුරිසො, සත්පුරුෂතෙම; සද්ධම්මසමන්නාගතො හොති, සද්ධ
ර්මසමාදානයෙන් යුක්තවත්තේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, සත්පුරුෂතෙම; කථ
ඤ්ච, කෙසේනම්; සප්පුරිසභත්ති හොති, සත්පුරුෂ භක්ති
ඇතිවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි; සද්ධො (බුද්
ධාදී රත්නත්‍රයකෙරෙහි පැවති) ශ්‍රද්ධාවඇත්තාවූ; හිරිමතො, (පාප
යෙහි ජුගුප්සාකාරයෙන් පැවති ලජ්ජාව ඇත්තාවූ)ඔත්තප්පිනො
(පාපයෙහි භයගැණීම් වශයෙන් පැවති) ඔත්තප්පයෙන් යුක්ත
වූ; බහුස්සුතො, බොහෝ ඇසීම් පිරීම් වශයෙන් බහුශ්‍රුතවූ; ආර
ද්ධවිරියො, පටන්ගත්නාලද වීර්‍ය්‍යඇත්තාවූ; උපට්ඨිතසති, නොනැ
ර පවත්නාලද සිහියෙන් යුක්තවූ; පඤ්ඤවන්තො, ප්‍රඥාවෙන්යුක්
තවූ; යෙ තෙ සමණබ්‍රාහ්මණා, යම් ඒ මහණ බමුණුකෙණෙක්
ඇද්ද; තෙ, ඔහු; අස්ස සප්පුරිසස්ස, ඒ සත්පුරුෂයාහට; මිත්තා
හොන්ති, මිත්‍රවත්නාහ; තෙ, ඔහු; සහායා හොන්ති, යහළුවෝ
නම්වූ. වන්නෝය; භික්ඛවෙ, මහණෙනි; එවංඛො, මෙපරිද්
දෙන් වනාහි; සප්පුරිසො, සත්පුරුෂතෙම; සප්පුරිසභත්ති හො
ති, (ශාන්තවූ ගුණයෙන් යුක්ත)සත්පුරුෂයන්හා භක්තිඇතිවත්
තේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, සත්පුරුෂතෙම; කථඤ්ච,
කෙසේනම්; සප්පුරිස චින්ති හොති, සත්පුරුෂ සිතිවිලි සිතන්
තේවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේලොකයෙහි; ස
ප්පුරිසො, (ආත්මාර්ථ පරාර්ථදත්තාවූ) සත්පුරුෂතෙම; නෙව
අත්තව්‍යාබාධාය චෙතෙති, තමහට අවැඩදායකවූ අකුසල ධර්ම
යන්හැර කුසලධර්මයෙහි චින්තනායකරන්නේය; න පරව්‍යාබා
ධාය චෙතෙති, පරහට අවැඩ දායකවූ අකුසලධර්මයන්හැර කුස
ල ධර්මයෙහිම සිතනබන්නේය; න උභයව්‍යාබාධාය චෙතෙති,
තමන්ටද අනුන්ටද වැඩදායකවූ කුසලධර්මයෙහිම සිතන්නේ
ය; එවංඛො, මෙසේ; (මෙපරිද්දෙන්වනාහි) භික්ඛවෙ, මහණෙ
නි; සප්පුරිසො, සත්පුරුෂතෙම; සප්පුරිසචින්ති හොති, මෙසේවූ
සත්පුරුෂ සිතිවිල්ලක්ම සිතන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, සත්පුරුෂතෙම; කථඤ්ච,
කෙසේනම්; සප්පුරිස මන්තී හොති,සත්පුරුෂ මන්ත්‍රණය කරන්
නේවේද;භික්ඛවෙ, මහණෙනි; ඉධ,මේලොකයෙහි;සප්පුරිසො,

සත්පුරුෂතෙම; නෙව අත්තව්‍යාබාධාය මන්තෙති, තමහට අවැඩදායකවූ අකුසලධර්මයන්හැර කුසලධර්මක්‍රියාවක්ම මන්ත්‍රණය කරන්නේය; න පරව්‍යාබාධාය මන්තෙති, පරහටඅවැඩදායකවූ අකුසලධර්මයන්හැර වැඩදායකවූ කුසලධර්මයෙහිම මන්ත්‍රණය කරන්නේය; න උභයව්‍යාබාධාය මන්තෙති, තමන්ටද අනුන්ටද අභිවෘද්ධිදායකවූ මන්ත්‍රණය කරන්නේය; එවංඛො, මෙසේද වනාහී; භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, සත්පුරුෂතෙම; සප්පුරිසමන්තී හොති, සත්පුරුෂ මන්ත්‍රණය ඇතිවන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි, සප්පුරිසො, (සසරභයදන්නාවූ) සත්පුරුෂතෙම; කථඤ්ච, කෙසේනම්; සප්පුරිසවාචො හොති, සත්පුරුෂවචන ඇතිවන්නේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි, සප්පුරිසො, (අසත්පුරුෂයන්ගේ දොෂදන්නා) සත්පුරුෂතෙම; මුසාවාදා, (නැත්ත ඇත්තකොට ඇත්ත නැත්තකොටකියන්නාවූ) මුසාවාදයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැලැක්කේවේද; පිසුනාවාචා,(දෙදෙනෙක් බිඳුවීමෙන්යයි කියනලද)පෛශූන්‍යවචනයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැලැක්කේවේද; ඵරුසාවාචා, ඵරුෂවචනකීමෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැලැක්කේවේද; සම්ඵප්පලාපා, මෙලොව පරලොව දෙකට වැඩනැති වචනයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැලැක්කේය; භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, (වාක්චාරයෙන් සිද්ධවන්නාවූ සුචරිත ධර්මයන් ඇති) සත්පුරුෂතෙම; එවංඛො, මේ ප්‍රකාරයෙන්; සප්පුරිසවාචො හොති, සත්පුරුෂ වචනඇති වන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො; සත්පුරුෂතෙම; කථඤ්ච, කෙසේනම්; සප්පුරිසකම්මන්තො හොති, සත්පුරුෂකර්මාන්ත ඇතිවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි; සප්පුරිසො, (පරහිංසායෙහි දොෂදන්නා) සත්පුරුෂතෙම; පාණාතිපාතා, ප්‍රාණාතිපාතයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැලැක්කේවේද; අදින්නාදානා, අදත්තාදානයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැලැක්කේවේද; කාමෙසු මිච්ඡාචාරා, කාමමිථ්‍යාචාරයෙන්;පටිවිරතො හොති, වැලැක්කේවේද; භික්ඛවෙ, මහණෙනි; එවං ඛො, මේ ප්‍රකාරයෙන්; සප්පුරිසො, (සසරභයදන්නා) සත්පුරුෂතෙම; සප්පුරිසකම්මන්තො හොති, සත්පුරුෂ කර්මාන්තඇතිවන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, සත්පුරුෂතෙම; කථඤ්ච, කෙසේනම්; සප්පුරිසදිට්ඨී හොති, සත්පුරුෂ දෘෂ්ටි ඇතිවේද, භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි; සප්පුරිසො, සත්පුරුෂතෙම; එවං දිට්ඨිකො හොති, මෙබඳු දෘෂ්ටිඇතිවන්නේය; අත්ථි

දින්නං, දෙනලද දානයෙහි ඵලවිපාකඇත්තේයයි කියාද; අත්ථි යිට්ඨං, කරණලද පූජාවෙහි ඵලවිපාක ඇත්තේයයි කියාද; අත්ථි හුතං, වෙහෙරට ගමන්කරවා කරණලද පූජාසත්කාරයෙහි ඵලවිපාක ඇත්තේයයි කියාද; අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, කුසලාකුසලකර්මයාගේ ඵලවිපාක ඇත්තේයයි කියාද; අත්ථි අයං ලොකො, පරලොව සිටියාහට මෙලොව ඇත්තේයයි කියාද; අත්ථි පරො ලොකො, මෙලොවසිටියහට පරලොව ඇත්තේයයි කියාද; අත්ථි මාතා, මෑනියන්ටකළ උපකාරයෙහි ඵලවිපාක ඇත්තේයයි කියාද; අත්ථි පිතා, පියානන්ටකළ උපකාරයෙහි ඵලවිපාක ඇත්තේයයි කියාද; අත්ථි සත්තා ඔපපාතිකා, ඔපපාතිකවඋපදිනා සත්වයෝ ඇත්තේයයි කියාද; ලොකෙ, ලොකයෙහි; සම්මග්ගතා, සම්‍යක්මාර්ගයට ගියාවූ; සම්මාපටිපන්නා, සම්‍යක්ප්‍රතිපත්තියෙන් යුක්තවූ; යෙ සමණබ්‍රාහ්මණා, යම්ශ්‍රමණ බ්‍රාහ්මණකෙණෙක්; ඉමඤ්ච ලොකං, මෙලොවද; පරඤ්ච ලොකං, පරලොවද; සයං අභිඤ්ඤාය, තමාවිසින්ම දැන; සච්ඡිකත්වා, සාක්ෂාත්කොට; පවෙදෙන්ති, ලොකයාහට ප්‍රකාශකොට කියන්නාහුද; (එබඳු මහණබමුණෝ;) අත්ථීති; ඇත්තේයයි කියාද; භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, (කායද්වාරයෙන් සිඩවූ සුචරිත ධර්මයන්ඇති) සත්පුරුෂතෙම; එවං ඛො, මේ ප්‍රකාරයෙන්; සප්පුරිස දිට්ඨි හොති, සත්පුරුෂ දෘෂ්ටි ඇතිවන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසො, (දානාතිසංසදන්නා) සත්පුරුෂතෙම; කථඤ්ච, කෙසේනම්; සප්පුරිස දානං දෙති, සත්පුරුෂවූ මහදන් දෙන්නේවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලොකයෙහි; සප්පුරිසො, සත්පුරුෂතෙම; සක්කච්චං,— (දෙය්‍යධර්ම යෙහිද ප්‍රතිග්‍රහණය කරණපුද්ගලයා කෙරෙහිද ආදර ඇතිව) සකස්කොට දන්දෙන්නේය; සහත්ථා දානං දෙති, තමාගේ ස්වහස්තයෙන්ම දන්දෙන්නේය; චිත්තීකත්වා දානං දෙති, සිතපිරිසිදුකොට දන්දෙන්නේය; අනපවිද්ධං දානං දෙති, තමාපියවන දෙයක්සේ සඟවා තබනලද නිධානයක් මෙන් ප්‍රියවස්තුවෙන්ම දන්දෙන්නේය; ආගමන දිට්ඨිකො දානං දෙති, මේ දානය වනාහී මා උපනුපන් ජාතියෙහි අත් නොහැර එන්නේයයි සිතා දන්දෙන්නේය; භික්ඛවෙ, මහණෙනි; එවං ඛො, මෙපරිද්දෙන් වනාහී; සප්පුරිසො, සත්පුරුෂතෙම; සප්පුරිස දානං දෙති, සත්පුරුෂ මහදන් දෙන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; එවං, මෙසේ; සප්පුරිසභත්ති, සත්පුරුෂභක්ති ඇත්තාවූ; එවං, මෙසේ; සප්පුරිසචින්ති, සත්


පුරුෂ සිහිවිලි ඇත්තාවූ; එවං, මෙසේ; සප්පුරිසමන්තී, සත්
පුරුෂ මන්ත්‍රණය ඇත්තාවූ; එවං, මෙසේ; සප්පුරිස වාචො,
සත්පුරුෂ වචන ඇත්තාවූ; එවං, මෙසේ; සප්පුරිසකම්මන්තො,
සත්පුරුෂකර්මාන්ත ඇත්තාවූ; එවං, මෙසේ; සප්පුරිසදිට්ඨී, සත්
පුරුෂදෘෂ්ටි ඇත්තාවූ; එවං, මෙසේ; සද්ධම්මසමන්නාගතො, ස
ද්ධර්මසමාදානයෙන් යුක්තවූ; සො බො සො සප්පුරිසො, ඒ මේ
සත්පුරුෂතෙම; එවං, මෙසේ; සප්පුරිස දානං දත්වා, සත්පුරුෂවූ
මහාදානය ප්‍රදානයකොට; කායස්ස භෙදා, කරජකායයාගේ භෙ
දයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; යා සප්පුරිසානං ගති,
යම් තැනක් සත්පුරුෂයාහට ගතිවීනම්; තත්‍ථ උපපජ්ජති, එතැන්
හි උපදනේය;-භික්ඛවෙ, මහණෙනි; සප්පුරිසානං ගති, සත්පුරු
ෂයන්ගේ ගතිය; කාච, කවරිද; දෙවමහන්තතාවා, දිව්‍යමහත්ත
ත්වය; නොහොත්; ශක්‍රයාහා බලපරාක්‍රම ඇතිව උපදීත්තේය; ම
නුස්සමහන්තතාවා ඉති, මනුෂ්‍යමහන්තත්වය, නොහොත්; චක්‍ර
වර්තී රජමෙන් උපදීන්නේය; නෙවත්, කෙළවර නිර්වාණ සම්ප
ත්තියට පැමිණෙන්නේයයි වදාළසේක.

භගවා, භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; ඉදං, අසත්පුරුෂ
සත්පුරුෂ ලක්ෂණකොට ඇති මේ චූලපුණ්ණමා සූත්‍රාන්ත ධර්ම
දේශනාව; අවොච, සකලසත්වකර්ණාමෘතකොට වදාළසේක—

අත්තමනා, ඉතා සන්තොෂභාවයට පැමිණියාවූ; තෙ භික්ඛු,
ඒභික්ෂූන් වහන්සේලා; භගවතො භාසිතං, භාග්‍යවතුන් වහන්
සේගේ වචනයට; අභිනන්දුංති, (සුභාෂිතය සුලක්ෂිතයයි කියා)
සන්තොෂයෙන් සාධුකාරදී මස්තකයෙන් පිළිගත්තාහුයි.

**චූලපුණ්ණමා සූත්‍ර ව්‍යාඛ්‍යාණය නිමි.**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු